# රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

# ඇබෑර්තු

## අධ්‍යක්ෂ ජනරාල් (01)

**(ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය - SLIDA)**

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ (SLIDA) ඉහත තනතුර සඳහා සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම් සහ නිපුණතාවන්**

- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විෂය පථයන්ට අදාළ උපාධියක් සහිත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධරයෙකු වීම සහ විධායක / කළමනාකරණ තනතුරුවල වසර 20 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා ඉන් අවුරුදු පහක (05) කාලයක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද ලබා තිබීම.

**හෝ**

- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විෂය පථයන්ට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**සහ**

- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ විධායක මට්ටමේ නිලධාරියෙකු වශයෙන් වසර 20 ක පළපුරුද්ද සහ ඉන් වසර තුනක් (03) අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු වශයෙන් සේවය කර තිබීම.

**හෝ**

- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විෂය පථයන්ට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් සහිත රජයේ හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ විධායක/ කළමනාකරණ තනතුරුවල වසර 20 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා ඉන් අවුරුදු පහක (05) කාලයක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ (HM2-1)පළපුරුද්ද ලබා තිබීම.
- වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට සහ රජයේ සේවකයන්ටඋපරිම වයස් සීමාව බල නොපායි.
- සියලු දත්ත ඇතුළත් ජීව දත්ත පත්‍රිකාව සමග අයදුම්පත්‍රය 2021 පෙබරවාරි මස 09 වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි, ලේකම්, රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, නිදහස් චතුරශ්‍රය, කොළඹ 07 යන ලිපිනය වෙත එවිය යුතුය. අයදුම්පත්‍ර බහලු කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර" යන්න සඳහන් කළ යුතුය.

**ජේ. ජේ. රත්නසිරි**
**ලේකම්,**
**රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.**

Source: Dinamina, Daily News (2021.01.27)